# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு
**MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE**


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/04/Circular/2018 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ......................................... | දිනය<br>திகதி<br>Date | 2018.03.07 |
|---|---|---|---|---|---|

## සමෘද්ධි චක්‍රලේඛ අංක :- 2018 /03 (ආර්ථික සවිබලගැන්වීම්)

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්.

### ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩසටහන - 2018
### ' සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීම සඳහා වූ '
### සමෘද්ධි අරුනළු කුඩා හා මධ්‍ය පරිමාණ සංවර්ධන වැඩසටහන

වසර 2030 වන විට දුගී බවෙන් තොර, සවිබල ගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහිකිරීමට කටයුතු කිරීමේ පුරෝගාමී ආයතනයක් බවට පත්වීම, දෙපාර්තමේන්තුවේ දැක්ම වන අතර 2017 වසරේ සිට සමෘද්ධිලාභීන් සවිබලගැන්වීම ඉලක්ක කර ගනිමින් ඊට අවශ්‍ය මූලික අඩිතාලම යෙදීමට දෙපාර්තමේන්තුවට හැකියාව ලැබිණි.

02. මෙහි පළමු පියවර යටතේ ඔබ ඇතුළු සමෘද්ධි සියළු නිලධාරින්ගේද සහභාගිත්වයෙන් සමෘද්ධිලාභින් සවිබල ගැන්වීම සඳහාවූ **'සමෘද්ධි අරුනළු කුඩා හා මධ්‍ය පරිමාණ සංවර්ධන වැඩසටහන'** 2017 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද අතර මේ සඳහා සියළු නිලධාරින් දක්වන ලද දායකත්වය අගය කොට සලකමි.

**03**. 2018 වර්ෂයේදි මෙහි දෙවන පියවර තුල සෑම දිස්ත්‍රික්කයක් විසින්ම නිශ්චිතව සවිබල ගැන්විය හැකි **ඉහළ ආදායම් කාණ්ඩයන්ට** අයත් සමෘද්ධිලාභී පවුල් ඉලක්ක කර ගනිමින් **"සමෘද්ධි අරුනළු කුඩා හා මධ්‍ය පරිමාණ සංවර්ධන වැඩසටහන"** ක්‍රියාත්මක කළ යුතු වේ.

04. මෙහිදි සැලසුම් හා මෙහෙයුම් අංශය විසින් නිකුත් කරන ලද සමෘද්ධි චක්‍රලේඛ අංක 2018/07 "සමෘද්ධිලාභින් සවිබලගැන්වීම" මඟින් පෙන්වා දී ඇති පරිදි පවුලේ සමාජික සංඛ්‍යාවට අනුරූපිව සකස් කර ඇති ආදායම් කාණ්ඩයන් හි සඳහන් ඉහළ ආදායම් කාණ්ඩය අදාල කර ගත යුතු වේ.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaram**

| | | | | | |
|---|---|---|---|---|---|
| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ (මානව සම්පත්)<br>பணிப்பாளர் ( மனிதவளம்)<br>Director (Human Resource) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 288** |
| | | **Hot Line :0112-889007** | | | |

05. මෙම වැඩසටහන යටතේ ව්‍යාපෘති ගැන්වීමට යෝජිත එක් එක් පවුල් සඳහා ශදූඅත (SWOT ANALYSIS) විශ්ලේෂණයක් කොට සෑම ව්‍යාපෘතියක් සඳහාම ව්‍යාපෘති වාර්තා සකස් කල යුතු වේ. *(ශදූඅත විශ්ලේෂණය හා ව්‍යාපෘති වාර්තාව සකස් කිරිමේදි භාවිතා කල හැකි සරල උදාහරණයක් ඇමුණුම් 1,2 වශයෙන් පෙන්වා දි ඇත.)*

06. එසේ සකස් කර ගන්නා ව්‍යාපෘති වාර්තාව, පිටපත් 04 කින් යුතුව සකස් කොට මුල් පිටපත ප්‍රතිලාභියාට අනෙකුත් පිටපත් සමෘද්ධි සංවර්ධන නිලධාරි, බැංකු කළමණාකරු, හා මූලස්ථාන කළමනාකරු වෙතද තබාගත යුතු අතර ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරිමට හා පසුවිපරම් කටයුතු කිරිමට මෙම නිලධාරින් කටයුතු කලයුතු වේ.

07. මෙහිදි සමෘද්ධි නිලධාරීන්, ප්‍රජා මූල සංවිධාන සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු හා අදාල තාක්ෂණික සහාය සේවා සපයන අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල ඒකාබද්ධතාවයෙන් යුතුව ආදායම වර්ධනය කල හැකි ජීවනෝපාය ව්යාපෘති හදුනා ගනිමින් සමෘද්ධිලාභි පවුල් සවිබල ගැන්වීම උදෙසා ව්‍යාපෘති සැලසුම් කළ යුතු වේ.

08. එමෙන්ම **<u>2017 වර්ෂයේදි ව්‍යාපෘති ගන්වන ලද පවුල් මෙම වර්ෂයේදි තෝරා නොගත යුතු</u>** අතර ඔවුන් සඳහා යම් ප්‍රග්ධන අවශ්‍යතාවයක් වේ නම් එය සමෘද්ධි චක්‍රිය ණය අරමුදලින් හෝ සමෘද්ධි ප්‍රජා මූල බැංකුවේ ණයක් මගින් ඉටු කර දිමට කටයුතු කල යුතුවේ.

09. එමෙන්ම 04 හි සඳහන් ආදායම් මට්ටමෙන් පහල, ආදායම් තල වල සිටින පවුල්, පහල අදායම් තලයේ සිට ඉන් ඉහල ආදායම් මට්ටමට ගෙන යාම සඳහාද චක්‍රිය ණය අරමුදලින් සහ ප්‍රජාමූල බැංකු ණය මගින් යම් වැඩපිළිවෙලක් 2018 වර්ෂය තුල ක්‍රියාත්මක කල යුතු අතර එය 2019 වර්ෂයේදි මෙම වැඩසටහනේ ඊළඟ අදියර ක්‍රියාත්මක කිරිම සඳහා මනා පිටිවහලක් ඔබට සපයනු ඇත.

**10. සමෘද්ධි ප්‍රජාව සවිබල ගැන්වීමට ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති**

ඒ අනුව පහත අංශයන් යටතේ දක්වා ඇති ව්‍යාපෘති හෝ එකී අංශ වලට අදාල ඕනෑම සාර්ථක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට මේ අනුව ඔබ වෙත උපදෙස් ලබා දෙමි.

**කෘෂි සංවර්ධන වැඩසටහන.**

- කුඩා පරිමාණ තේ වගා දිරි ගැන්විම
- දේශිය ආහාර බෝග වගා ප්‍රවර්ධනය (උදා. උඳු, මුං, කුරක්කන්)
- වෙළඳපොල අභිමුඛ කරගත් එළවළු හා පලතුරු වගාව
- කැපුමල් හා විසිතුරු මල්
- බිම්මල් වගාව
- මී මැසි පාලනය (වානිජ මට්ටමේ)
- පැල තවාන් ඇති කිරීම හා වැඩි දියුණු කිරීම
- අගය එකතු කළ නිෂ්පාදන ප්‍රවර්ධනය
- ආරක්ෂිත ගෘහ තුල බෝග වගාව
- අවාරයේ බෝග වගාව
- කුඩා පරිමාණ කෘෂි ක්ෂේත්‍ර යාන්ත්‍රිකරණය

**සත්ත්ව පාලන වැඩසටහන.**

- දියර කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම.
- ගවගාල් ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම.
- බිත්තර නිෂ්පාදන ව්‍යාපෘති.
- වෙනත් සත්ත්ව පාලන ව්‍යාපෘති (උදා:- එළු පාලනය ආදී)

**ධීවර කර්මාන්ත සංවර්ධනය.**

- ආහාර පිණිස පොකුණු තුල මත්ස්‍ය වගාව.
- විසිතුරු මත්ස්‍ය හා ජලජ පැලෑටි නිෂ්පාදනය.
- කරවල, උම්බලකඩ, ජාඩි වැනි අගය එකතු කල ධිවර නිෂ්පාදන ප්‍රවර්ධනය.
- සුළු ධීවර කර්මාන්තය නඟා සිටුවීම.

**සුළු කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන වැඩසටහන.**

- කුඩා පරිමාණ ඇඹරුම් මධ්‍යස්ථාන ඇතිකිරීම.
- ජංගම දුරකථන අළුත්වැඩියා හා සන්නිවේදන මධ්‍යස්ථාන පිහිටුවීම.
- තල්, පොල්, කිතුල් ආශ්‍රිත නිෂ්පාදන.
- මැටි ආශ්‍රිත නිශ්පාදන
- ලුහු ඉංජිනේරු කර්මාන්ත (කම්මල් / පැස්සුම් ආදී කර්මාන්ත)
- ප්‍රධාන නිෂ්පාදන කර්මාන්ත වලට අවශ්‍ය අමතර කොටස් නිෂ්පාදනය කිරීම.
- ඔටෝ මොබයිල් සේවා.(මෝටර් කාර්මික ශිල්පී, ටින්කරින්, පිංතාරු කිරීම, එන්ජින් අළුත්වැඩියාව, සේවා මධ්‍යස්ථාන, කුෂන් වැඩපලවල්)

➢ සවිබලගැන්විය හැකි ප්‍රතිලාභී පවුල් සඳහා ජීවනෝපාය සංවර්ධන කටයුතු වලට ඉවහල් වන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා ද අවධානය යොමු කළ හැකි වේ. එහිදී එම අවශ්‍යතාවය පැහැදිලිව සඳහන් කර එය සාධරණීයකරණය කිරීම සඳහා ව්‍යාපෘති වාර්තාව සමග ඇස්තමේන්තුව ඉදිරිපත් කල යුතුය.

## 11. රැකියා අභිමුඛ වෘත්තීය පුහුණු පාඨමාලා වැඩසටහන.

සමෘද්ධිලාභී පවුල්වල පාසල් අධ්‍යාපනය අවසන් කර ශ්‍රම බලකායට එකතු වන වයස අවුරුදු 18 -35 අතර තරුණ තරුණියන් ඉලක්ක කරගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ හැකි අතර එක් පුද්ගලයෙක් සෘජුවම රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණුවකට යොමු කිරීම තුලින් එම සමෘද්ධිලාභී පවුලම සවිබල ගැන්වීය හැකි බැවි විශේෂයෙන් පෙන්වා දෙමි.

ඒ අනුව පවුල් සවිබලගැන්විය හැකිවීමේ වැඩි දායකත්වය සැලකිල්ලට ගෙන ඔබ දිස්ත්‍රික්කය වෙත මෙම වැඩසටහන යටතේ වෙන්වන මුළු ප්‍රතිපාදන ප්‍රමාණයෙන් 15% ක් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට යෙදවීම කෙරෙහි අවධානය යොමු කිරීම වඩාත් සුදුසු වනු ඇත.

අප දෙපාර්තමේතුව විසින් මේ වන විටත් ඇමුණුමේ 03 හි සඳහන් ආයතන හා සම්බන්ධ වෙමින් මුලික සාකච්ඡාවන් පවත්වා ඇති බැවින් සෘජුවම රැකියාව ඉලක්ක කරගත් එම පාඨමාලාවන් සඳහා ඔබ දිස්ත්‍රික්කයන්හි සමෘද්ධි ප්‍රතිලාභි පවුල්වල තරුණ තරුණියන් යොමු කිරිමට වැඩි අවධානයක් යොමු කල යුතුවේ.

## 12. පොදු උපදෙස්

I. හැකිතාක් සෑම වසමක්ම නියෝජනය වන පරිදි ව්‍යාපෘතිලාභීන් හඳුනාගත යුතුවේ.

II. යෝජිත සෑම ව්‍යාපෘතිලාභියෙකුගේම ගෙවත්ත "සමෘද්ධි ආදර්ශ ගෙවතු සංවර්ධන වැඩසටහන - 2018 " මඟින් උපදෙස් ලබා දී ඇති පරිද්දෙන් සංවර්ධනය කිරිම අත්‍යාවශ්‍ය වනු ඇත.

III. ව්‍යාපෘතියක් සඳහා හඳුනාගනු ලබන ප්‍රතිලාභියා ප්‍රජාමූල සංවිධානයේ සමාජිකත්වය ලබා ගැනීම අනිවාර්යවේ.

IV. එම ප්‍රතිලාභීන් මෙම වසර අවසානයේදී සැලකිය යුතු ඉහළ ආදායම් මට්ටමකට පැමිණ ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වුන පවුලක් ලෙස නම් කිරීමට හැකියාවක් පවතී දැයි ශක්‍යතාවය මැනවින් පරීක්ෂා කර බලා යෝජිත ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම අත්‍යාවශ්‍ය වේ.

V. සමෘද්ධි ප්‍රතිලාභියා දිළිඳුකමින් මුදවා ගැනිම සඳහා ආර්ථික, සමාජීය, දේශපාලන, ශාරිරික, මානසික හා නෛතික වශයෙන් බල ගැන්වීම සිදුවිය යුතු බැවින් මෙවර ප්‍රතිලාභීන් ව්‍යාපෘති ගැන්වීමේදි ඒ කෙරෙහි අවධානය යොමු කිරිම අත්‍යාවශ්‍ය වනු ඇත.

VI. එමෙන්ම සවිබලගැන්වීම යනු ස්වේච්ඡාවෙන් තම සමෘද්ධි සහනාධාර හිමිකම් පත්‍රය තමාට වඩා අඩු ආදායම්ලාභියෙකුට ලබා දීම සඳහා දෙපාර්තමේන්තුව වෙත ප්‍රදානය කිරිම වන අතර එසේ නොමැතිව සමෘද්ධි සහනාධාර හිමිකම ප්‍රතිලාභියාගේ කැමැත්තෙන් තොරව කපා හැරිම නොවන බව අවධාරණය කරමි.

VII. ඉහත 05 හි සඳහන් පරිදි සකස් කර ගනු ලැබූ ව්‍යාපෘති වාර්තාව සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ සමාලෝචනයට ලක්කර අනුමත කළ යුතුය. තවද අදාල රේඛීය ආයතන වල තාක්ෂණික නිලධාරීන්ගේ නිර්දේශයන්ද ලබා ගත යුතුය. සමෘද්ධි සංවර්ධන නිලධාරි, කලාප කළමණාකරු ව්‍යාපෘති කළමණාකරුගේ නිර්දේශය සහිතව මූලස්ථාන කළමණාකරු වෙතට එම වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

VIII. මූලස්ථාන කළමණාකරු විසින් අදාල ව්‍යාපෘති වාර්තා සඳහා තම නිර්දේශය සහිතව ප්‍රදේශීය සම්බන්ධීකරණ කමිටුව පිහිටුවා තිබේ නම් එහි එකඟත්වය ද ලබාගෙන ඉන් අනතුරුව ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය.

IX. අවම වශයෙන් 40% ක ප්‍රතිලාභී දායකත්වයක් ලබාගත යුතු අතර එය ශ්‍රමය, අමුද්‍රව්‍ය හෝ වෙනත් දායකත්වයක් විය හැකිය.

X. ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුවේ.

XI. දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් විසින් තම ප්‍රතිපාදන සීමාවන්ට යටත්ව නිශ්චිතව හඳුනාගත් සවිබල ගැන්විය හැකි අනුමත ව්‍යාපෘති සඳහා ඇමුණුම 04 මඟින් අධ්‍යක්ෂ ජනරාල් වෙතින් අග්‍රිම ඉල්ලීම් කළ යුතු වේ.

XII. ව්‍යාපෘති ආරම්භ කිරීම, අඛණ්ඩව පවත්වාගෙන යාම, ප්‍රතිලාභී දායකත්වය ලබා ගැනීම නිසි පරිදි සිදු කරන බවට ප්‍රතිලාභීන් සමග ගිවිසුම් ගත විය යුතුය. ප්‍රාදේශීය ලේකම් හෝ ඒ වෙනුවට බලය පවරන ලද සමෘද්ධි මූලස්ථාන කළමණාකරු, ප්‍රතිලාභීන් සමඟ ගිවිසුමකට එළඹීම අත්‍යාවශ්‍ය වේ. (මේ සඳහා ආදර්ශ ආකෘතියක් ඇමුණුම 05 මඟින් දක්වා ඇත.)

XIII. ප්‍රතිලාභී දායකත්වය සඳහා සමෘද්ධි ප්‍රජා මූල බැංකු මගින් ජීවනෝපාය චක්‍රීය ණය ලබාදීම සම්බන්ධීකරණය කළ යුතු අතර ඒ සඳහා එම බැංකු වල විධි විධානයන්ට අනුව කටයුතු කළ යුතුය.

XIV. වෘත්තීය පුහුණු පාඨමාලා හැර අනෙකුත් අංශ වල ව්‍යාපෘති සඳහා අත්‍යාවශ්‍ය විෂයානුබද්ධ පුහුණු වැඩසටහන් ලබාදීම අවශ්‍ය වුවහොත් විධිමත් සැලැස්මක් ඉදිරිපත් කර අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතුවේ.

XV. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රමවේදය මුදල් රෙගුලාසි, මෙම චක්‍රලේඛ උපදෙස් හා අදාල වෙනත් චක්‍රලේඛ උපදෙස් අනුගමනය කරමින් ක්‍රියාත්මක කල යුතු අතර සම්මත මිලගණන්ද සැලකිල්ලට ගෙන අදාල රේඛීය ආයතන වල නිර්දේශයන්ද ලබා ගෙන ගෙවීම් කිරීම අත්‍යාවශ්‍ය වේ.

XVI. සියළුම ව්‍යාපෘති සඳහා සිදු කළ යුතු ගෙවීම් 2018.12.15 දිනට පෙර අවසන් කිරීමට හැකි වන සේ ව්‍යාපෘති ආරම්භ කිරීමට වග බලා ගතයුතුය. කාලීනව ආරම්භ කළ යුතු ව්‍යාපෘති (උදා:- කෘෂි) හැර අනෙකුත් ව්‍යාපෘති හැකි ඉක්මනින් ආරම්භ කිරීම වැදගත් වේ.

XVII. ව්‍යාපෘති හඳුනා ගැනීම මාර්තු 25 දිනට පෙර අවසන් කළ යුතු වේ.

XVIII. දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් තම දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කල යුතු ජීවනෝපාය ව්‍යාපෘති යෝජනාවන් කෙරෙහි සමස්ථ අධීක්ෂණය සිදුකල යුතු වේ. මාසිකව ප්‍රගතිය සමාලෝචනය කරමින් වඩාත් ඵලදායිව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු අතරම ඔබ දිස්ත්‍රික්කයට නියමිත **' ඉලක්ක '** ලඟාකර ගැනීම සඳහා නිරන්තර අවධානයක් යොමු කිරීම මින් අවධාරණය කරමි.

**13.** කාල රාමුව

| අනු අංකය | ක්‍රියාකාරකම | දිනය |
|---|---|---|
| 1. | නිලධාරීන් දැනුවත් කිරීම හා අදහස් ලබා ගැනිම. | 2018.01.15 සිට |
| 2. | චක්‍රලේඛ නිකුත් කිරීම | 2018.03.08 ට පෙර |
| 3. | ග්‍රාමීය මට්ටමේ සියළු පාර්ශවයන් එක්ව ව්‍යාපෘති හඳුනා ගැනීම/ ව්‍යාපෘති සැලසුම් කිරීම ( ව්‍යාපෘති වාර්තාව සකස් කිරීම) හා අදාල නිර්දේශ ඉදිරිපත් කිරීම. | 2018.03.25 ට පෙර |
| 4. | ව්‍යාපෘති අනුමත කර ගැනීම. | 2018.03.30 |
| 5. | මුදල් අග්‍රිම ඉල්ලීම. | 2018.03.30 |
| 6. | ව්‍යාපෘති ආරම්භ කිරීම. | 2018.03.30 සිට |
| 7. | ප්‍රගතිය වාර්තා කිරීම. | මාසිකව |

**14.** **ව්‍යාපෘති අධීක්ෂණය,මෙහෙයුම් හා ඇගයුම් කටයුතු**

I. මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඊ - සමෘද්ධි ව්‍යාපෘතියේ (e – samurdhi Project) ඇති ව්‍යාපෘති හා වැඩසටහන් කළමණාකරණ මොඩියුලයට (Project & Programme Management Module) ඇතුලත් කිරීමටත් ප්‍රගතිය නිසි පරිදි නියමිත දිනටම යාවත් කාලීන කිරීමටත් ව්‍යාපෘති කළමණාකරු මෙම වසරේ සිට කටයුතු කිරීම **අත්‍යාවශ්‍ය** වනු ඇත.

II. ව්‍යාපෘති අධීක්ෂණය හා පසු විපරම් කිරීමේ ක්‍රමවේදය ඔබ විසින් සකස් කර ගැනීමට කටයුතු කල යුතු අතර ප්‍රාදේශීය මට්ටමටද අවශ්‍ය උපදෙස් ලබාදීම වැදගත් වේ. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගති සමාලෝචනයන් සිදු කල යුතු අතර ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගී වීම අත්‍යාවශ්‍ය වේ.

III. මෙහිදී ප්‍රජා මූල සංවිධානද ව්‍යාපෘති අධීක්ෂණය සඳහා සහභාගී කරවා ගත යුතු අතර, සමාජ විගණනයන් සඳහා අවශ්‍ය පරිසරයක් ඇති කල යුතු වේ.

IV. අවශ්‍ය ඕනෑම විටක ලබා ගැනීමට හැකි වන පරිදි ව්‍යාපෘති දත්ත, තොරතුරු හා ඡායාරූප සකස් කර තබා ගත යුතුය.

V. එකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු වැඩසටහනට අනුව ප්‍රතිලාභියා එකියා ගැන්වෙන තෙක් හා ලබාගත් ණය මුදල් ගෙවා අවසන් වන තෙක් ප්‍රජා මූල සංවිධානය හා සමෘද්ධි සංවර්ධන නිලධාරින් මගින් අඛණ්ඩව පසු විපරම සිදුකළ යුතුවේ. යම් ප්‍රතිලාභියෙකු අතරමඟ වෘත්තීය පුහුණුව ලබා ගැනිම නතර කරන්නේ නම් අදාල ආයතනය වෙත ගෙවන ලද දෙපාර්තමේන්තු දායකත්වය නැවත ලබා ගත හැකිවන පරිදි ගිවිසුම් ගතවීමට ක්‍රියාකල යුතුවේ.

## **15.** **ප්‍රතිපාදන නිදහස් කිරිම.**

එක් ප්‍රතිලාභී ව්‍යාපෘතියක් වෙනුවෙන් අනුමත කළ හැකි උපරිම දෙපාර්තමේන්තු දායකත්වය රු. 45,000/- ක් වන අතර ඔබ දිස්ත්‍රික්කයට වෙන් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය මේ සමඟ ඔබ වෙත දන්වා එවීමට කටයුතු කරනු ඇත.

අනුමත භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රමාණය හා ජීවනෝපාය චක්‍රිය ණය අරමුදල උපයෝගී කර ගනිමින් ඔබ දිස්ත්‍රික්කය තුල නිශ්චිතව සවිබල ගැන්විය යුතු ප්‍රතිලාභින් ප්‍රමාණය හෝ ඊට වැඩි ප්‍රමාණයකින් **‘ ලබාදී ඇති සංවර්ධන ඉලක්ක’** ළඟා කර ගැනිම සියළු නිලධාරින් සතු රාජකාරි වගකීමකි.

## **16.** **පරිපාලන වියදම්**

ව්‍යාපෘති සඳහා දරනු ලබන රජයේ වියදමෙන් 2.0% ක් පරිපාලන වියදම් ලෙස දැරීමට හැකියාව ඇත. මෙයින් 0.5% ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා ද, ඉතිරි 1.5%, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ද වන පරිදි වේ.

## 17. කාර්යය සාධනය

i. 2018 වර්ෂයේදි නිලධාරි කාර්යය සාධනය හා ඇගයීම කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු යොමු කර ඇත.

ii. මෙහිදි සෑම නිලධාරියෙකු විසින්ම තමාට නියමිත රාජකාරි කටයුතු සාර්ථකව හා කාර්යක්ෂමතාවයෙන් ඉටු කිරිම වෙනුවෙන් වු කාර්යය සාධනය සඳහා වු ඇගයීම් ක්‍රමවේදයක් සකස් කර ඇති අතර ඒ තුලින් සමෘද්ධි ව්‍යාපාරයේ මූලික අරමුණ වන දිළිඳුකම පිටුදැකීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය සාර්ථක කර ක්‍රියාවේ නැංවීමට අපේක්ෂිත බවද විශේෂයෙන් පෙන්වා දෙමි.

මෙම චක්‍රලේඛය පිළිබඳව වැඩි දුර විස්තර අවශ්‍ය වුවහොත් දුරකතන අංක 011-2873801 / 011-2869824/ 011-2872253 මගින් හෝ divinegumalh@yahoo.com විද්‍යුත් තැපැල් ලිපිනය මගින් ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන අංශය අමතන්නේ නම් මැනවි.

ආචාර්ය, සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳව
   ගරු අමාත්‍ය එස්.බී දිසානායක මැතිතුමා - කා.දැ.ගැ.පි.
2. සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳව
   ගරු නියෝජ්‍ය අමාත්‍ය රංජන් රාමනායක මැතිතුමා - කා.දැ.ගැ.පි.
3. සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ලා - කා.දැ.ගැ.ස.
4. සියළුම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ලා - කා.දැ.ගැ.ස.
5. ලේකම්, සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳව - කා.දැ.ගැ.ස.
6. අතිරේක ලේකම් (ග්‍රාමීය සංවර්ධන /සමෘද්ධි),
   සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳව - කා.දැ.ගැ.ස.
7. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් -කා.දැ.ගැ.ස හා අ.ක.ස
8. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
9. ප්‍රධාන ගණකාධිකාරි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
10. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
11. සියළුම අංශ ප්‍රධානීන් , සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
12. සියළුම සමෘද්ධි මූලස්ථාන කළමණාකරුවන් - අ.ක.ස හා මහා සංගම් කළමණාකාර අධ්‍යක්ෂ / සමෘද්ධි ව්‍යාපෘති /ප්‍රජා මූල බැංකු කළමණාකරුවන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් දැණුම්වත් කිරීම සඳහා